බණ මඩුව

"අසන්නට නොව අවබෝධයට..."

**නිර්මාංශ වීම අවබෝධයෙන් කරමු**

අපි භාවනා කරන අය වශයෙන් මස් මාංශ වලින් වැළකී සිටිය යුතුම ද?

මේක දිග කථාවක්. මම කොයි වෙලාවක හරි ජීවක සූත්‍රයෙන් බණක් කියන්නම්. බුදුරජාණන් වහන්සේ අනුදැන වදාරපු මාංශයක් තියනවා. ඒ මාංශය ගන්න පුළුවන්. ඒකට කියනවා ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශය කියලා. මස් මාංශවලින් වැළකිලා ඉන්න කියලා දේශනා කරලා නෑ කොහේවත්. මස් මාංශයෙන් වැළකිලා ඉන්නම කියලා දේශනා කරලා නෑ.

දැන් ඔන්න කට්ටියගේ ඔළුව නරක්වුනා, හිතත් අවුල් වුනා. අපි මෙච්චර අමාරුවෙන් මස් මාංශයෙන් වැළකුනා. වැළකෙන්නට ඕන නේද? මේ හාමුදුරුවොත් කියනවා, මට පේන්නේ හාමුදුරුවන්ටත් ඕන වෙලා වගේ කියලා. ඔන්න ඔය ප්‍රශ්ණෙ එන හින්දා විතරක් මම නිර්මාංශ වෙලා ඉන්නවා. එතකොට මට මොකුත් කියන්න කාටවත් බෑ. මිනිස්සු ඔය කාරණයෙන් මට ගහනවා. ඕකෙන් ගහන හින්දා මම මස් මාංශයෙන් වැළකිලා ඉන්නවා. ඕකෙන් ගහන හින්දා වැළකිලා ඉන්නේ ඇත්තම කියනවා නම්. එතකොට කාටවත් මොකුත් කියන්න බෑ හාමුදුරුවන්ට ඕන වෙලා නේ ඔහොම කියන්නේ කියලා.

මස් මාංශවලින් වැළකීම තමන් වෙනුවෙන්, තමන් අරමුණු කරලා යම්කිසි සත්ත්වයෙක් ඝාතනය වෙනවා නම් අන්න ඒ අවස්ථාවේදි ඒකෙන් වැළකීම වටිනවා. ඇයි? මේ ලෝකෙට අපි ඉපදුනා. අපි කරපු පුණ්‍ය මහිමයකින්, කර්මයකින් මේ ලෝකේ යම්කිසි ඉඩක් අරගෙන ඇවිත් තියෙන්නේ හැම සත්ත්වයෙක් ම. හැමෝම එහෙම ද? නැද්ද? මට මොකක්ද තියන අයිතිය තවත් සත්ත්වයෙකුගේ ජීවිතයක් නැතිකරන්න. ඇත්තටම නිවන් දකින්න සූදානම් වෙන කෙනාට තියෙන්න ඕන සංකල්ප තමයි නෙක්ඛම්ම සංකල්පනා, අව්‍යාපාද සංකල්පනා, අවිහිංසා සංකල්පනා. ඒ අවිහිංසාව කොච්චරක් ද කියනවා නම් මහ වැස්සක් වහිනකොට **අනේ මේ වැස්සෙන් ඔය ඉන්න කෘමි සතෙකුටවත් හානියක් නොවේවා** කියන හැඟීමක් තමන්ට තියෙන්න ඕන. ඒ අවිහිංසා සංකල්පනාව **අප්පනා, ව්‍යප්පනා, චේතසෝ අභිනිරෝපනා** දක්වා හිතෙහි ප්‍රබලත්වයකින් නැඟෙන මට්ටමකට මේක ඉස්සෙන්න ඕන මාර්ග හිතක් පහළ වෙන්න. දේශනා කරලා තියෙන්නේ එහෙමයි. මාර්ග අංගයක් වෙනකොට සම්මා සංකප්පය එච්චර එහාට යන්න ඕන. අවිහිංසා සංකල්පනාව එච්චට එහාට දියුණු කරගත්ත කෙනෙකුට **මා නිසාවෙන් තවත් මාත්‍රීය රිදීමක් කිසිම සත්ත්වයෙකුට සිද්ධ නො විය යුතුයි** කියන තැනට එයාට එන්න වෙනවාද? නැද්ද? එවැනි තැනකට මගේ හිත පත්කරගන්න ඕන. ජීවිත ආශාව තිබුනොත් භවයක් සකස් වෙනවා. නිවන් දකින්න විතරක් පවත්වා ගන්නවා මිස, රස විඳීමට, අරගෙන යන්න, පවත්වා ගන්න ආදී අවශ්‍යතාවලින් අයින් වෙන කෙනාට මේ ශරීරය පවත්වා ගන්න තවත් ශරීරයක මාංශයක අවශ්‍යතාවයක් එන්නේ නෑ.

ඒක ඉහළ මානසිකත්වයක්. මම ඕකට කියන්නේ ඉහළ මානසිකත්වයක් කියලා. ඒ ඉහල මානසිකත්වය තියන කෙනා මස් මාංශ ගන්නවා නම් ගන්නේ තමන් ව අරමුණු නො කරපු දෙයක් විතරයි.

මෙන්න මේ මාංශය ගැන පොඩ්ඩක් හිතන්න. අපි වාහනයක යනකොට ඉස්සරහ වාහනයකට කුකුළෙක් අහුවෙනවා. ඒ වාහනය යනවා, කුකුළා දඟලලා දඟලලා මැරිලා පාරේ වැටෙනවා. ඔන්න ඔය කතාව කියනකොට මාත් එක්ක ගැටෙනවා සමහර අය. අන්න ඒ ගැටීම වැරදියි කියලයි මම මේ කියන්නේ. ඒ එක අන්තයකට වැටිච්ච හින්දයි ඒකත් එක්ක ගැටෙන්නේ. මේ බලන්න. කුකුළා මැරිලා වැටිලා දැන් පොළවට පස් වෙලා යන සතෙක් වෙලා. දැන් ඒකේ ප්‍රාණයක් නෑ. මෙන්න මේ මාංශය කාටවත් අයිතිත් නෑ. දැන් මේක පාරේ වැටිලා තියන එකක්. මට හොඳටම විශ්වාසද නැද්ද මේ සතා මැරුනේ මම හින්දා නෙවෙයි කියලා? මට හොඳටම විශ්වාසද නැද්ද මේ සතා මැරුනේ මම හින්දා නෙවෙයි, මේ සතාගේ මරණය මම හින්දා සිද්ධවෙච්ච දෙයක් නෙවෙයි කියලා. අන්න ඒ මාංශය මට කැපයි. ඒක හරියට ගහකින් වැටිච්ච කොස් ගෙඩියක් වගේ. ගහකින් වැටිච්ච කොස් ගෙඩියක් හැබැයි පෙරේතකමින් කන්න ගත්තොත්? **අප්පේ කොස් දැක්ක කාලයක්, කවුරුවත් ආවොත් දෙන්න වෙයි** කියලා? එතන ලෝභ ද්වේෂ මෝහ උපදිනවා.

ජීවක සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මගේ ශ්‍රාවකයා ප්‍රණීත ආහාරයෙන් මාව නැවත වළඳවයි කියලා හැඟීම් මාත්‍රයක් වත් ඇතිකර ගන්නෙ නෑ කියලා. එතකොට මස් ගැන කථාවක් නෑ එතන. අන්න එහෙම තත්ත්වයක තියන එකක් ජීවක සූත්‍රයේ තියෙන්නේ මෛත්‍රිය ගැන. මෛත්‍රිය කරුණාව මුදිතාව උපේක්ඛාව කියන හතරේම විහිදුවාගෙන, පතුරුවාගෙන ජීවත්වෙන කෙනෙක් කියලා. එහෙම කෙනෙක් මෙහෙම තමන් වෙනුවෙන් මරපු මාංශයක් වළඳන්නෙ නෑ. අන්න එතකොට ඒක ත්‍රිකෝටික පාරිශුද්ධ වෙනවා. **අදිට්ඨං අසුතං අපරිසංකිතං -** මම දැක්කෙත් නැතිවෙන්න ඕන මම වෙනුවෙන් මැරුවා කියලා, ඇහුවෙත් නැතිවෙන්න ඕන, සැකයකුත් නැතිවෙන්න ඕන. දැක්කෙත් නැතිවෙන්න ඕන, ඇහුවෙත් නැතිවෙන්න ඕන, සැකයකුත් නැතිවෙන්න ඕන. අන්න එහෙම මාංශයක් කෙනෙකුට ආහාරයට ගන්න පුළුවන්කම තියනවා.

තමන් වෙනුවෙන් අරමුණු නො කරපු මාංශයක් මේ ලෝකේ තියනවාද නැද්ද? තියනවා. ඒ මොකක්ද? අර වගේ අහම්බෙන් මැරිච්ච සතෙක්. මෙන්න මේක මගේ පෞද්ගලික මතයක්. එහෙම කිව්වාම මේ කාරණය කථා කරන්න පහසුයි. නමුත් මේක සූත්‍රයට හරි එකඟයි. නැත්නම් අර වගේ ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශයක් දාන්න ඕන නැනේ. අහම්බෙන් ඔය වගේ මොනවාහරි අනතුරක් වෙලා මැරිච්ච සතෙක් ගැටළුවක් නෑ. ඒකත් හැබැයි ලෝභ ද්වේෂ මෝහ තියාගෙන කෑවොත් නිවණට බාධා වෙනවා, ඉන්ද්‍රිය සංවරය නැතිවෙනවා, ආහාරයේ මාත්‍රඥතාවය නැතිවෙනවා.

සල්ලිවලට ගන්න මාංශය තමයි ප්‍රශ්ණය තියෙන්නේ. උදාහරණයක් විදිහට කිව්වොත් ලංකාවේ ජනාධිපතිතුමා කියනවා ලංකාවේ සියළු පුරවැසියන්ට බලපවත්වන පරිදි ඇඳිරි නීතිය පණවනවා කියලා. කවුද අරමුණු කලේ? සියල්ලම. එහෙනම් සියල්ලම අරමුණු කිරීමක් කියලා එකක් තියනවා නේද?

ලංකාවේ ධීවරයෙක් යනවා දැලත් අරන්. කාව අරමුණු කරගෙනද දන්නේ නෑ යන්නේ? ඕස්ට්‍රේලියාවේ ඉන්න අය ද? නෑ. මම මේ මරාගෙන එන මාළු ලංකාවේ මිනිස්සු ගන්නවා කියලා දන්නවා. පාරිභෝගිකයා අරමුණු කරන් යන්නේ. මගේ නමින් අරමුණු කළේ නෑ. නමුත් පාරිභෝගිකයා අරමුණු කළා. නුවණින් හිතලා බලන්න. නිවන් දකින්න ඕන අය නුවණින් හිතලා බලන්න මම හින්දා අංශු මාත්‍රිය පීඩනයක් කාටවත් ඇති නො විය යුතුයි. මේක නීතියක් නම් නෙවෙයි. එහෙම ශීලයක් පණවලා නෑ. කායානුපස්සනාව වඩන්න කියලා කියන එක ශීලයක් ද? නෑ. ශීලයක් කොට පණවලා නෑ. පඤ්ච ශීලය විතරයි පණවලා තියෙන්නේ. මේකෙන් පන්සිල් කැඩෙන්නෙත් නෑ. ඉහල මානසිකත්වයක් ඇතිකර ගත යුතු අය ඒ ගැන මෙනෙහි කරත්වා. එච්චරයි. ඒකත් එක්ක අපි මැරෙන්න යන්න දේකුත් නෑ.

ඉහල මානසිකත්වයක් ඇතිකර ගන්න බලාපොරොත්තු වෙන අය ඒ ගැන මෙනෙහි කරන්න. ඕක විතරක් නෙවෙයි, තව මෙනෙහි කරන්න ගොඩාක් දේවල් තියනවා. මේ කට? මේ කටින් කොච්චර අනිත් අයව රිදවනවද? වචනවලින් කොච්චර රිදවනවද? තවත් කෙනෙකුගේ හිතකට කඩු පහරක් ගහනවා වගේ ඒවා කොච්චර කියනවද? ඒ හැම එකකින්ම අයින් වෙනවා. නිවන් දකින්න බලාපොරොත්තු වෙන කෙනා යහපත් සංකල්පනා වලට එනකොට මල් වගේ වචන එන්න ඕන. හැම වෙලේම ශාන්තයි. හැම වෙලේම සැලකිල්ලෙන් ඉන්නවා කවුරු මොන වැරැද්ද ඔය පැත්තෙන් කළත් මේ පැත්තෙන් මම එයාව රිදවන්නේ නෑ. අන්න ඒ වගේ ගැඹුරු ජීවිතයකට එන්න පුළුවන් වෙන්න ඕන. එහෙම නැත්නම් මේ වැඩේ කරන්න බෑ. අවිහිංසා සංකල්පය එච්චර ඉහලට නැගෙන්න ඕන. එහෙනම් බෑ. මේක එහෙම නෑ, කුලමල ඇදගෙන කියවනවා, තරම ඇදගෙන කියවනවා, මුදල් පැත්තෙන් මට්ටම් හදාගෙන කියවනවා. බලන්නකෝ මිනිසුන්ගේ අනිත් අයව තළාපෙලා දමන්න කොයි තරම් නම් දේවල් ලැහැස්ති කරන් තියනවාද කියලා මිනිස්සු. ලොකුකම් කියයි, එක එක දේවල් කියයි. ඒවා සියල්ලෙන් ම බැහැර වෙලා හැම කෙනෙකුටම එක වගේ සලකන සමානාත්මතාවයෙන් යුක්ත කෙනෙක් බවට පත්වෙන්න ඕන. ඒක මේ වචනයට තියන එකක් නෙවෙයි. ඒවා මහා ගැඹුරු තත්ත්වයන්. ඒවා මහා ගැඹුරු ප්‍රබල හැඟීම්. අන්න ඒ තැන්වලට යන කෙනෙකුට මම හින්දා කිසියම් ම සතෙකුට හාණි මාත්‍රයක්වත් නො විය යුතුයි කියන තැනට එන්න වෙනවා. අන්න ඒ තැන ගැන හිතාගන්න පුළුවන් අය ඔය මාංශය ගැන හිතාගත්තු දෙන්.

නමුත් හොඳ එකක් තියනවා. සමහර අය නිර්මාංශ වෙනවා. නිර්මාංශ වෙලා සත්තු ගැන කරුණාවෙන් කියලා මාංශ වළඳන අයට හොඳට රිදවනවා. එතකොට එතන මොකද වෙන්නේ? අනුන්ට ගහන්න තියෙන්නේ අශූචියෙන් කියලා හිතන්න. අශූචි ගොඩ අල්ලන්න එපැයි ගහන්න. ගත්ත ගමන් කොහේද ගෑවිලා තියෙන්නේ? අනුන්ගේ ගාවන්න හැදුවේ, ගෑවෙන්නේ අතේ. ඒ වගේ මාංශ වළඳන අයත් එක්ක ද්වේෂ සහගතව කටයුතු කරන කෙනෙක් ඉන්නවා නම් එයාට අර ආනිශංසයෙන් කෑල්ලක් නැතිව යනවා. තමන්ගේ මේ ප්‍රතිපත්තිය නිහඬ තත්ත්වයක තියාගන්න. තමන්ගේ ප්‍රතිපත්තිය අනුන්ට ගැරහීම සඳහා නොවෙයි. ශීලය කඩන අයට නම් ගැරහුවාට කමක් නෑ. මේක ශීලයක් කොට පණවලා නැහැනේ. ශීලය කඩන අයට පොඩ්ඩක් ඇනලා කියන්න ඕන ශාසනයට හාණියක් වෙනවා මනුස්සයෝ ඔය ශීලය කඩන්න එපා කියලා. මේවා බුදුරජාණන් වහන්සේ තමන්ගේ ආකල්ප සංවර්ධනය කරගන්න අයට පණවපු දේවල්. ඒවා ශීලයක් කොට ගන්න බෑ. ඒවා මානසික තත්ත්වයන්. අවිහිංසාව සංවර්ධනය වෙන අය තුල ඇතිවිය යුතු, ඒ අවිහිංසාවත් එක්ක අනිත් අය කෙරෙහි තියන කරුණාවකුත් එන්න ඕන. කරුණාවෙන් නේ අවිහිංසාව කියන එක එන්නේ. ඒක හින්දා ඒක තමන්ගේ අතේ තියන වැඩක්. ඒක ප්‍රදර්ශනය සඳහාත් නොවෙයි, ඒක අන් අය හෙළා දැකීම සඳහාත් නොවෙයි, තමන්ව හුවා දැක්වීම සඳහාත් නොවෙයි. ඒක ඇතුලාන්ත ගැඹුරක්.

මොකද කියන්නේ සාධාරණ ද? නැද්ද? එච්චරයි. දැන් කියයි කාශ්‍යප හාමුදුරුවෝ කිව්වා සල්ලි දීලා ගන්න මාංශය ගන්න එපා කිව්වා කියලා. කන්න පුළුවන් ක්‍රමයක් තියනවා, මම ඕන නම් කියලා දෙන්නම්. ඕන ම නම් කන්න පුළුවන් ක්‍රමයක් තියනවා. මම පාත්තරෙත් අරන් පිණ්ඩපාතේ යනවා නොදන්න පළාතක හදිස්සියෙන් ම. පාත්‍රයත් අරන් පිණ්ඩපාතේ යනකොට ඒ පැත්තේ හිටිය මිනිස්සු මම එනවා කියලා කොහොමවත් ම දන්නේ නෑ කියලා මට හොඳටම විශ්වාසයි. මගේ පාත්‍රයට මාළු මස් දානවා. කිසි

ප්‍රශ්ණයක් නෑ. ඇයි? මම හොඳටම දන්නවා මේ මාංශය මම හින්දා නොවෙයි කියලා. ඒකයි කියන්නේ භික්ෂූන් වහන්සේට මස් මාංශ වළඳන්න පුළුවන් කියලා.

හිතන්න මම එදාම හැන්දෑවේ ගමේ රවුමක් යනවා. යනකොට මම දකිනවා කට්ටිය බිළී කොකුත් අරගෙන යනවා. මට හිතෙනවා මේ කට්ටිය යන්නේ මට මාළු මරන්න තමයි කියලා. එතකොට එතන ඉන්න කට්ටියක් කියනවා **හෙට උදෙත් හාමුදුරුවෝ පිණ්ඩපාතේ වඩියි, අපි යමු, මාළු මරමු** කියලා. අන්න ඇහෙනවා.

දැන් මම රවුමකුත් ඇවිද්දා, දැක්කෙත් නෑ, ඇහුනෙත් නෑ. ඒ කියන්නේ දිට්ඨං කියන ප්‍රශ්ණෙත් නෑ, සුතං කියන ප්‍රශ්ණෙත් නෑ. නමුත් මම උදේ පිණ්ඩපාතේ යනවා ඒ පැත්තේම. ඒ පැත්තේම පිණ්ඩපාතේ යනකොට කෙනෙක් මට මාළු දාන්න හදනවා පාත්තරේට. දැක්කෙත් නෑ, ඇහුවෙත් නෑ. හැබැයි මට සැකයක් උපදිනවා හිතේ. බලන්න බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය තුළ අපිට රිංගන්න තැන් නෑ. අවංකව, ඉතා අවංකව ජීවත් වෙන කෙනාට ආයේ තමන්ට බොරු කරගන්න බෑ. මට සැකයක් උපදිනවා. මොකක්ද උපදින සැකය? **මං හින්දා ඇත්තටම මැරුවාද දන්නේ නෑ. ඊයේ මම මාළු පිළිගත්තා මගේ පාත්තරේට. ඊයේ ගත්තා පාත්තරේට, ඒ හින්දා මේ කට්ටිය ගිහින් මැරුවාද දන්නේ නෑ.**

අපි හිතමු අපි දෙනමක් ගියා කියලා. මම කියනවා **මම හින්දා මැරුවද දන්නේ නෑ** කියලා. එතකොට අනිත් කෙනා කියනවා **නෑ නෑ එහෙම වෙන්න විදිහක් නෑ** කියලා. දැන් තර්කයක් ඇතිවෙනවා. යමක් පිළිබඳ තර්ක ඇතිවෙන්නේ සැක නම් විතරයි. සාමාන්‍යයෙන් තර්ක ඇතිවෙන්නේ සැක සහිත දේවල් වලට නේ. ස්ථිරවම දන්නවා නම් තර්කයක් ඇතිවෙන්නෙ නෑ නේ. අර මැරිච්ච කුකුල් නාම්බා ගැන අපි දෙගොල්ලන් අතර තර්කයක් ඇතිවෙයිද මේක මම හින්දයි, මම හින්දා නොවෙයි කියලා? නෑ, තර්කයක් ඇතිවෙන්නේ නෑ. ඒක ප්‍රත්‍යක්ෂයි.

සල්ලි දීලා ගන්න මාංශය ගැන කථාකරන්න ගියොත් තර්කයක් ඇතිවෙනවා. දාම ක්‍රමයට ගත්තොත් අපි සල්ලි දෙන හින්දා එයා අහවලාට දුන්නා, අහවලාට දුන්නා, අහවලාට දුන්නා, මාව අරමුණු කළා. තව කෙනෙක් කියනවා නෑ ඉතින් මගේ නමින් අරමුණු කළේ නෑ නේ. ඔය විදිහට තර්ක. තර්ක ඇතිවෙන්නේ කුමක් හින්දාද? සැක හින්දා. තර්ක ඇතිවෙනවා නම් සැකයි. බුදුරජාණන් වහන්සේ සැක නම් මොකද කරන්න කිව්වේ? එපා කිව්වා. ඔන්න ඔය පදනම අපේ කට්ටිය ගන්නේ නෑ. එතන තියනවා හොඳ තර්කයක්. මොකක්ද? සැක නම් අයින් කරන්න කිව්වා. අන්න ඒක වහගන්නවා. වහගන්නේ මොකද? අංශු මාත්‍රීය සැපයක් තියනවා දිවට මස් රස දැනෙද්දි, බැදපු මාළු, වැව් මාළු. අනුරාධපුර පැත්තේ යනකොට අනේ අප්පේ අර ලැලි වල ඉන්න සත්තු දඟලනවා. දඟලන මාළු ගෙනල්ලා. ලැල්ලේ ඉන්න අය දඟලනවා වෙලාවකට. සමහර රටවල් වල දඟලන සතාව කන්න කැමතියි. බාගෙන බදිනවාලු පණ තියෙද්දි. පණ තියෙද්දි කන්න මිනිස්සු කැමතියි කියලා. එහෙමනේ නේද? අපූරු බල කැල්ල, ලේ පාටට තියනවා නම්, කළු පාට වෙලා වගේ නැත්නම් අපේ මිනිස්සුත් මාළු කැල්ල ගැන මොකද කියන්නේ? **ෂෝක් මාළු කැල්ල** කියනවා. Fresh කියනවා. අමානුෂික ගතියක් නැත්තෙමත් නෑ නේද?

මගෙන් අහපු ප්‍රශ්ණෙකට මම මෙන්න මෙහෙම උත්තරයක් දුන්නා. මේකට අයේ කට උත්තර නෑ. දාම ක්‍රමය පැත්තකින් තියන්නකෝ. මම යනවා කුකුල් මස් ගන්න කියලා. මට අළුත් කුකුල් මස් ඕන කියලා. යනකොට පාම් එකක මරපු කුකුල්ලු හය දෙනෙක් විතර එල්ලලා තියනවා. දැන් මරලා නේ, මම වෙනුවෙන් නෙවෙයි නේ. ප්‍රශ්ණයක් නෑ, මම වෙනුවෙන් නෙවෙයි කියලා අර හයෙන් එකක් ගන්නවා. අරගෙන මීටර් දෙසීයක් විතර ඇවිල්ලා ආපහු හැරිලා බලනකොට ආයේ හයක් එල්ලලා තියනවා කොක්කේ. ආයේ හයක් වුනේ කොහොමද? මම අර කුකුළා ගත්තු හින්දා මේ මනුස්සයා ඇතුලට ගියා, අතනින් කුකුළෙක් අල්ලා ගත්තා, එන ගමන්න ඔළුව දොරේ ගැහුවා, දොරට තියලා තද කළා කෑ ගහද්දි. ඊට පස්සේ මොකද කළේ? උණුවතුර එකක එබුවා. පණපිටින්ම දඟලන සතාගේ තටු ටික අයින් කරලා අතන ගෙනල්ලා බෙල්ල කපලා කොක්කේ එල්ලුවා. ඒකාව මරන්න අනුග්‍රහය දැක්වුවේ කවුද? මට තිබුනානේ **අර මරන්න ඉන්න එකාව දෙනවා** කියලා ගන්න තිබුනා නේ අර මනුස්සයාගෙන්. එහෙනම් මගේ අනුග්‍රහයක් තියනවා. මේ එල්ලලා තියන කුකුල් මස මට කන්න ඕනෑ කමේ තියන මළපෙරේතකම හින්දා තව සතෙක් මැරුණා. එතකොට මගේ අවිහිංසා ප්‍රශ්ණෙට ගැටළුවක් එනවා. මොකද? මම හින්දා එහා පැත්තේ එකා මැරෙන්න හේතු වෙනවා. මගේ මේ දිව පිණවීමේ ගතිය තව එකෙක් මැරෙන්න හේතුවක් වෙනවා කියන එක දාම ක්‍රමයෙන් අපිට ගැලවෙන්න බෑ. ඒක අතහැරීමට ලොකු හේතුවක් වෙනවා. හරි අමාරු අතහැරීමක් මෙතන තියනවා ආහාරය පිළිබඳව.

මෙතන ප්‍රශ්ණ ගොඩයි, වෛද්‍ය මත ආදිය. වෛද්‍ය මත කියලා හොඳට පෝෂණයෙන් ඉඳලා ඇක්සිඩන්ට් එකක් වෙච්ච ගමන් ඉවරයි, සර්පයෙක් ගහපු ගමන් ඉවරයි, නිව්මෝනියාව හැදිච්ච ගමන් ඉවරයි. කොහොමත් ඉවර වෙන්න තියන එක වෛද්‍යවරයාගේ කැල්සියම් ප්‍රශ්ණය, විටමින් ප්‍රශ්ණය ඔක්කෝම තියාගෙනත් අන්තිමට මැරෙනවා. ඔය විටමින් ඔක්කෝම ගානට සමතුළිත කරගෙන හිටියට කමක් නෑ කවදාකවත් මැරෙන්නේ නැත්නම්.

ලෝකයේ පර්යේෂණ අනුව වැඩි ආයු කාලයක් ජීවත් වෙච්ච අය බලනකොට නිර්මාංශ අය. මේකේ තේරුම නිර්මාංශ වීමට බලකිරීම වත්, මත ඉදිරිපත් කිරීම වත්, තර්ක කිරීමවත්, වෛද්‍ය විද්‍යාව ගැරහීම වත් නොවෙයි. තමන්ට නිවන් දකින්න. නිවන් දකින්න ගියාම සම්මතයේ තියන හුඟාක් දේවල් එක්ක ප්‍රශ්ණනේ. ළමයි අතහැරලා යන්න වෙනවා නේ. හුඟාක් අය කියනවා මේ ධර්මය අමානුෂිකයි කියලා. ඔව් ඉතින්. මානුෂික වුනා නම් ඉතින් යනවා. මනුස්ස කියන තත්ත්වය ඉක්මවා දේවත්වයකට එන්නේ. දේවත්වය කියන තත්ත්වය ඉක්මවා බ්‍රහ්මත්වයකට එන්නේ. බ්‍රහ්මත්වය කියන තත්ත්වය ඉක්මවා අරිහත් තත්ත්වෙට එන්නේ. එහෙනම් මනුස්ස මට්ටමේ ඉඳලා අරිහත් තත්ත්වෙට යනවා කියන කතාවක් එන්න බෑ. මනුස්සයාගේ සාමාන්‍ය ජීවිතය ඉපදෙනවා, කනවා බොනවා, නානවා අඳිනවා, විවාහ වෙනවා, වර්ගයා බෝ කරනවා, ගෙවල් හදාගන්නවා, පරම්පරාවට සේවයක් කරනවා, මැරෙනවා. ඒකනේ මනුස්ස. මනුස්ස තත්ත්වේ ඉඳලා අරිහත් තත්ත්වෙට යන්න හදන කෙනා මනුෂ්‍ය සීමාව කඩන්න ඕන. එතකොට අසම්මතයි. කරන්න දෙයක් නෑ. සම්මතයත් එක්ක තර්ක කරන්න යන්න එපා. සම්මතත් එක්ක මරාගන්න යන්න එපා අසම්මත වෙන්න බලාපොරොත්තු වෙන අය නිහඬව අසම්මත වෙනවා. ඒක නිහඬ ක්‍රියාවක්. සම්මතයේ ඉඳලා කරන්න පුළුවන් පඤ්ච ශීලය. ඒක කරනවා නේ. ඒක කරන්න ඇරලා එතනින් එහාට කථා කරන්න.

අපි කරන්නේ පඤ්ච ශීලයෙන් ගොඩ එන්න දෙන්නෙත් නැතිව අර පඤ්ච ශීලයේ ඉන්න කෙනාටම මස් ප්‍රශ්ණ අරං ගහනවා, තව එක එක විටමින් ප්‍රශ්ණ අරං ගහනවා, ඇයි මේ? එයාලත් එක්ක තර්ක විතර්ක කරන්න යන්න නෙවෙයි අවශ්‍යතාවය. තමන්ගේ අභිවෘර්ධිය සඳහා කටයුතු කිරීම විතරයි. මම ආයේ මතක් කරනවා මේක තර්කයක් ඇතිකර ගැනීම සඳහා නොවෙයි. ඒකයි මම කිව්වේ මම මස් කන්න එපා කියන්නේ නැහැ. මට ඒක අදාල නැහැ. තම තමන්, තම තමන් ගේ විශුද්ධිය පිළිබඳ දැනගනිත්වා. ඒක තමන්ගේ පැත්තෙන් තියන වැඩක්. ඒකට අපේ කිසිම තර්කයක් විතර්කයක් අවශ්‍ය නෑ. තමන්ගේ අවිහිංසා සංකල්පය වර්ධනය කරගැනීම සඳහා විතරයි මේක. ඒකයි ඉහළ මානසිකත්වයක් කියලා කියන්නේ.

මොකද කියන්නේ? එහෙම හොඳ නැද්ද? තම තමන්, තම තමන් ගේ පාඩුවේ කරගන්න ඕන වැඩක් ඒක. එච්චරයි. ශීලයවත් ආභරණයක් නො විය යුතුයි. සමාධිය ආභරණයක් නො විය යුතුයි. ප්‍රඥාව ආභරණයක් නො විය යුතුයි. බුද්ධ ශාසනයේ ධර්මය අවබෝධ කරන අය එන්න එන්න පහළට වැටෙනවා. අනිත් අය ඉදිරියේ පහළට වැටෙනවා. ධර්මය අවබෝධයත් එක්ක මාන්නය නැතිවෙන්න ඕන. ධර්මය මාන්නය සඳහා වුනොත් වැරදි තැනකින් අල්ලාගෙන.

(අතිපූජණීය උඩුදුම්බර කාශ්‍යප ස්වාමීන් වහන්සේ ගේ ධර්ම දේශනාවක් ඇසුරින්)